International Federation of
Library Associations and Institutions

# ජාත්‍යන්තර සුචිකරණ මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය

ඉෆ්ලා **IFLA** (පුස්තකාල සංගම් සහ ආයතනවල ජාත්‍යන්තර සම්මේලනය) සුචිකරණ අංශය සහ ජාත්‍යන්තර සුචිකරණ නීති මාලාවන් සැකසීමේ ඉෆ්ලා **IFLA** විද්වත් මණ්ඩල හමුව විසිනි.

2016 සංස්කරණය

ඇග්නස් ගැලේෆි (මුලසුන), මරියා වයලෙටා බර්ටෝලනී, රොබට් එල්.බොන්වාන්, එලීනා එස්කොලානෝ රොද්‍රිගුයෙස් සහ ඩොරති මැක්ග්‍රේ විසිනි.

2016 දෙසැම්බර්
ඉෆ්ලා **IFLA** සුචිකරණ ස්ථාවර කමිටුව සහ ඉෆ්ලා **IFLA** ප්‍රමිති සම්බන්ධ කමිටුව මඟින් අනුමත කරන ලදී. ඉෆ්ලා **IFLA** විද්වත් කමිටුව මඟින් ස්ථිර කරන ලදී.

සිංහල පරිවර්තනයකි. **Sinhalese Translation**

අයිරංගනී මුදන්නායක **B.A.(Ceylon) M.L.S.(Philippines) F.L.A(Sri Lanka)** විසින් සිංහලට පරිවර්තනය කරන ලදී.

ඔක්තෝබර් 2018

ඉංග්‍රීසියෙන් රචිත මුල් ප්‍රකාශය සිංහලට පරිවර්තනය කිරීමේ දී මුල් පිටපතට වඩා වෙනස්කම් ඇතිවිය හැකිය. මෙම පරිවර්තනය හුදු විමර්ශන කටයුතු සඳහා පමණි.

CC BY මරියා වයලෙටා බර්ටෝලනී, රොබට් එල්.බොන්වාන්, එලීනා එස්කොලානෝ රොද්‍රිගුයෙස් සහ ඩොරති මැක්ග්‍රේ ,2016

සංස්කාරක මණ්ඩලය (2016/2017)

- නීතා දමයන්ති පීරිස් (ප්‍රධාන සංස්කාරක)
- ඩිල්මණී වර්ණසූරිය
- තුෂාරි සෙනවිරත්න
- සුනේත්‍රා කාරියවසම්
- මෂ්රූෆා මොහමඩ් මජීඩ්
- සුභ්‍රමනියන් නවණීදක්‍රිෂ්නන්

**ග්‍රන්ථ සමීක්ෂණය :** පී. ආර්. පද්මසිරි [B.A. (Hons.) Kelaniya, MLS (Col.), FLA (Sri Lanka)]

ISBN: 978-955-9075-31-8

© 2016 මරියා වයලෙටා බර්ටෝලනී, රොබට් එල් බොක්මාන්, එලීනා එස්කොලානෝ රොද්‍රිගුයෙස්, ඇග්නස් ගැලෙෆි සහ ඩොරති මැක්ග්‍රේ මෙම කර්තව්‍ය CC By 4.0 යටත බල පත්‍ර ගතකර ඇත. මෙම බලපත්‍රයෙහි පිටපතක් බැලීම සඳහා https://creativecommons.org/licenses/by/4.0 වෙබ් අඩවියට පිවිසෙන්න.

IFLA
P.O. Box 95312
2509 CH Den Haag
Netherlands

www.ifla.org

## සංස්කාරක සටහන

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 2017-2022 උපායමාර්ගික සැලැස්මට සමගාමීව 2016/2017 ප්‍රකාශන කමිටුව විසින් ඉෆ්ලා ආයතනය මගින් ප්‍රකාශිත විද්වත් වාර්තා 4ක් සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති පරිදි මෙම පරිවර්තන කර්තව්‍යයේ මූලික අරමුණ වූයේ දේශීය භාෂාවලින් පුස්තකාල විද්‍යා ප්‍රකාශන හිඟවීමත්, ඒ හේතුවෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරන සිසුවන්ට මෙන්ම, පුස්තකාලයාධිපතීන්ට විවිධ දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදු වී ඇති බැවින් එම අපහසුතා මඟහරවා ගැනීමේ පිළියමක් ලෙසිනි. තවද අන්තර්ජාතික මට්ටමේ ඇති තොරතුරු පුස්තකාලයාධිපතීන්ට සහ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරන ශිෂ්‍යයන්ට දැනගැනීමට සැලැස්වීමත් මෙම ව්‍යාපෘතියේ තවත් එක් අරමුණක් විය.

මෙම ව්‍යාපෘතිය මගින් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද ***'ජාත්‍යන්තර සුචිකරණ මූලධර්ම පිළිබඳ ප්‍රකාශනය'*** යන ඉෆ්ලා ලේඛනය තුළින් පුස්තකාලයාධිපතීන්ට සහ පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරන ශිෂ්‍යයන්ට සහ අනිකුත් පාඨකයන් හට ජාත්‍යන්තර සුචිකරණ මූලධර්ම පිළිබඳ විශාල දැනුම් සම්භාරයක් ලබා ගත හැකි වේ යැයි විශ්වාස කරමි.

මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා සහාය වූ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ටත්, එහි සෝදුපත් බලා සමීක්ෂණ කටයුතු සිදු කළ සමීක්ෂකවරුන්ටත් ස්තුතිය පුදකරමි. එසේම මෙම පරිවර්තන ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමට මහඟු පිටුවහලක් ලබාදුන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිනිය ඇතුළු පාලක හා විධායක මණ්ඩළ සාමාජිකයින්ටත් මාගේ කෘතඥතා ස්තුතිය පිරිණමමි.

**නීතා දමයන්ති පීරිස්**

ප්‍රධාන සංස්කාරක

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

## පටුන

0 හැඳින්වීම (Introduction)……………………………………………………………………………………………….5

1. විෂය පථය (Scope) …………………………………………………………………………………………………..7

2 . සාමාන්‍ය මූලධර්ම (General Principles)……………………………………………………………………………7

3. නිර්මාණ (Entities) ගති ලක්ෂණ (Attributes) සහ සම්බන්ධතා (Relationships)……………………….9

4 ග්‍රන්ථ විiාත්මක විස්තරය (Bibliographic Description)……………………………………………………11

5 ප්‍රවේශ මාර්ග (Access Points)……………………………………………………………………………………11

6. සුචියෙහි අරමුණු සහ ක්‍රියාකාරිත්වයන් (Objectives and Functions of the Catalogue)…………….16

7. ගවේෂණ හැකියාවන් සඳහා පදනම් (Foundations for search Capabilities)…………………………..17

8. පාරිභාෂික ශබ්ද මාලාව (Glossary)………………………………………………………………………………20

9. මූලාශ්‍ර (sources)……………………………………………………………………………………………………24

10. 2016 ප්‍රකාශනයේ තවදුරටත් භාවිතා නොවන පද (terms no longer used in 2016 statement).25

11. පසුවදන (Afterword)…………………………………………………………………………………………………26

## 0 හැඳින්වීම

මුල්ම සුචිකරණ මූලධර්ම ප්‍රකාශය ලෙස සැලකෙන, (Original statement of principles) "පැරිස් මූලධර්ම" ලෙස ප්‍රකට (Paris Principles) සුචිකරණ මූලධර්ම ප්‍රකාශය 1961[1] වසරේ පැරිස් නුවර පවත්වන ලද ජාත්‍යන්තර සුචිකරණ මූලධර්ම සම්මේලනය (International Conference on Cataloguing Principles) විසින් සම්මත කර ගන්නා ලදී. මෙම සම්මේලනයේ ප්‍රධාන ඉලක්කය වූ සුචිකරණය ජාත්‍යන්තර වශයෙන් ප්‍රමිතිකරණයට භාජනය කිරීමේ (International standardization in cataloguing) පදනම නිසැකවම ඔවුන් විසින් සාක්ෂාත් කර ගන්නා ලදී. ඒබව සනාථ වන්නේ මින් පසුව ලොවපුරා බිහිවූ සුචිකරණ නීතිමාලාවන්ගෙන් (cataloguing codes) වැඩිකොටසක් මෙම ප්‍රමිතිගත සුචිකරණ මූලධර්මයන් මුළුමනින්ම හෝ ඉතා ඉහළ මට්ටමකින් අනුගමනය කර තිබීමයි.

මින් වසර පනහකට වැඩි කාලයකට පසුව පොදු ජාත්‍යන්තර සුචිකරණ මූලධර්ම පද්ධතියක අවශ්‍යතාවය තවදුරටත් දැනෙන්ට වූයේ ලොව පුරා සිටින සුචිකරුවන් සහ පුස්තකාල පරිශීලකයින් විඥාපන ගවේෂණය සහ සමුද්දරණය (search and discovery systems) සඳහා මාර්ගගත සුචි (Online catalogues) පද්ධති භාවිතා කිරීම නිසාය. 21 වන සියවස ආරම්භයේ දී, ඉෆ්ලා IFLA සංවිධානය (ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනය) මඟින් නව මූලධර්ම ප්‍රකාශයක්[2] (2009 වසරේ ප්‍රකාශිත) මාර්ගගත සුචි සහ ඉන් ඉදිරියට බිහිවෙන පද්ධති සඳහා නිර්මාණය කරන ලදී. වර්තමානයේ භාවිතා කරනු ලබන සංස්කරණය (Version) 2014 සහ 2015 වසරවලදී ප්‍රතිශෝධනය කොට යාවත්කාලීන කරන ලදුව 2016 වසරේ දී සම්මත කර ගන්නා ලද්දකි.

2009 වසරේ දී හඳුන්වා දෙන ලද මූලධර්ම ප්‍රකාශය මගින් පැහැදිලි වශයෙන් ම "පැරිස් " සුචිකරණ මූලධර්මයන්ගේ විෂය පථය (scope) පුළුල් කර ඇත. "පැරිස් " මූලධර්මයන් විසින් ආවරණය කරන ලද හුදු මුද්‍රිත මාධ්‍යයන් (textual resources) සඳහා පමණක් සීමා නොවී ඕනෑ ම විඥපන මාධ්‍යයක් (all types of resources) සඳහා උපයෝගී කරගත හැකිවන ආකාරයට නව සුචිකරණ මූලධර්ම ප්‍රකාශය සකස් කරන ලදී. තව ද "පැරිස් " මූලධර්මයන්හි සුචි සංලේඛවල ශීර්ෂ තෝරාගැනීම සහ ඒවා සටහන් ගත කරන ආකෘතියෙන් (choice and form of entry) ඔබ්බට ගොස් පුස්තකාල සුචි මඟින් නිරාවරණය කළ යුතු සියලුම ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරි දත්ත (bibliographic and authority data) නව සුචි මූලධර්ම ප්‍රකාශය මඟින් එළි දැක්විණි. මෙම ඉෆ්ලා (IFLA) සුචිකරණ මූලධර්ම ප්‍රකාශයේ, සුචිකරණ මූලධර්ම සහ සුචිකරණ අරමුණු (principles and objectives) පමණක් නොව අන්තර්ජාතික වශයෙන් සුචිකරණ නීති මාලාවන් (cataloguing codes) සකසන විට ඇතුලත් කලයුතු මාර්ගෝපදේශයන් (guiding rules) සහ විඥපන ගවේෂණය සහ සමුද්දරණයේ දී (search and retrieval) පුස්තකාල සුචිවල හැකියාව පිළිබඳවද මගපෙන්වීම් ද කර ඇත.

1. *International Conference on Cataloguing Principles (Paris : 1961). Report*. London: International Federation of Library Associations, 1963, p. 91-96. Also available in: Library Resources & Technical Services, v. 6 (1962), p. 162-167; and *Statement of principles adopted at the International Conference on Cataloguing Principles, Paris, October, 1961*. Annotated edition with commentary and examples by Eva Verona. London: IFLA Committee on Cataloguing, 1971.

2. IFLA Cataloguing Principles: Statement of International Cataloguing Principles (ICP) and its Glossary. München: K.G. Saur, 2009. (IFLA Series on Bibliographic Control; v. 37). Statement available online <www.ifla.org/publications/statement-of-international-cataloguing-principles>.

මෙම 2016 වසරේ සංස්කරණය ප්‍රධාන වශයෙන් අළුතින් බිහිවෙන විවිධාකාර පරිශීලක ප්‍රජාව (new categories of users) කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, සීමා රහිත, නිදහස් ලෙස විඥාපන වලට පිවිසීමේ පසුබිම, (open access environment) දත්තයන්ගේ අන්තර් ක්‍රියාකාරීත්ව හැකියාව (interoperability) සහ දත්ත වෙත පහසුවෙන් පිවිසීමේ හැකියාව, (accessibility of data), විඥාපන ගවේෂණයේ දී භාවිතා කරන විවිධ මෙවලම්වල තිබිය යුතු ගුණාංග, (features of discovery tools) සහ පරිශීලක ප්‍රජාව විඥාපන සොයන ආකාරයේ සැලකියයුතු වෙනස්වීම් ආදී කරුණුද, සැලකිල්ලට ගෙන ඇත.

පහත සඳහන් මාතෘකා මෙම ඉෆ්ලා (IFLA) සුචිකරණ මූලධර්ම ප්‍රකාශයෙන් ආවරණය වී ඇත.

1. විෂය පථය (Scope)
2. සාමාන්‍ය මූලධර්ම (General Principles)
3. නිර්මාණ (Entities), ගතිලක්ෂණ (Attributes) සහ සම්බන්ධතා (Relationships)
4. ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (Bibliographic Description)
5. ප්‍රවේශ මාර්ග (Access Points)
6. සුචියක අරමුණ සහ කාර්යභාරය (Objectives and Functions)
7. විඥාපන ගවේෂණයේ දී සුචිය සතුවිය යුතු හැකියාවන් සඳහා පදනම් (Foundations for Search Capabilities)

මෙම ප්‍රකාශය ලොව[3] පැවති සුචිකරණ මහා සම්ප්‍රදායන් (great cataloguing traditions) පදනම් කරගෙන බිහිවූ අතර ඉෆ්ලා (IFLA) ජාත්‍යන්තර පුස්තකාල සංගම් සම්මේලනයේ කාර්යාත්මක අවශ්‍යතා හඳුනාගන්නා සංසදයේ[4] (IFLA fuctional Requiremqnts Family) සංකල්පමය ආකෘතීන් (conceptual Models) අනුවද සැකසුනි.

මෙම ප්‍රකාශයේ ඇති සුචිකරණ මූලධර්මයන්ගෙන් අපේක්ෂා කරනුයේ අන්තර්ජාතික වශයෙන් ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්තයන් හුවමාරුව ඉහල නැංවීමට උපකාරීවීම සහ (international sharing) සුචිකරණ නීති නිර්මාපකයින්ට (cataloguing rule makers) මාර්ගෝපදේශකත්වය ලබා දීමක් ය.

---

3. Cutter, Charles A. *Rules for a Dictionary Catalog*. 4th ed., rewritten. Washington, D.C.: Government Printing office, 1904; Ranganathan, S.R. *Heading and Canons*. Madras [India]: S. Viswanathan, 1955; and Lubetzky, Seymour. *Principles of Cataloging. Final Report. Phase I: Descriptive Cataloging*. Los Angeles, Calif.: University of California, Institute of Library Research, 1969.

4. Functional Requirements: the FRBR Family of Models <www.ifla.org/node/2016>. Being currently under a consolidation process, this statement reflects some uncertainties of the transitional phase.

## 1. විෂය පථය (Scope)

මෙම ප්‍රකාශයේ ඇති මූලධර්ම සූචිකරණ නීතිමාලාවන් (cataloguing codes) සංවර්ධනය කිරීම සහ සූචිකරුවන්ට තීරණ ගැනීමේ දී මාර්ගෝපදේශයක් ලෙස යොදා ගැනීම අරමුණු කොට ගෙන ඇත. මෙම මූලධර්ම ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්ත (bibliographic and authority data) සඳහා භාවිතා කළ හැකි අතරම අවසානයේ (consequently) වර්තමාන පුස්තකාල සූචි (library catalogues), ග්‍රන්ථනාමාවලි (biibliographies), සහ පුස්තකාල විසින් නිර්මාණය කරන අනෙකුත් විඥපන, දත්ත පද්ධතීන් (data sets) සඳහා භාවිතා කළ හැකිය.

මෙම මුලධර්මයන් ඕනෑම මාදිලියේ විඥ්‍යාපන මාධ්‍යයන් (bibliographic resources) සවිස්තරාත්මකව (descriptive) සහ විෂයාත්මකව සූචිකරණය කිරීම සඳහා (subject cataloguing) ස්ථාවර ප්‍රවේශයක් (consistent approach) ලබා දීම අරමුණු කොට ගෙන ඇත.

## 2 . සාමාන්‍ය මූලධර්ම (General Principles)

පහත දැක්වෙන මූලධර්ම සූචිකරණ නීති මාලාවන් (cataloguing codes) නිර්මාණය කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම සඳහාත්, සූචිකරුවන් සූචිකරණයේ දී ගන්නා තීරණ සහ සූචිකරණ දත්ත වලට ප්‍රවිශ්ට වීම සහ දත්ත හුවමාරු කිරීම (policies on access to and exchange of data) සඳහා ප්‍රතිපත්ති සැකසීම සඳහාත් යොමුකර ඇත. මෙම කරුණු අතුරින් සූචි භාවිතා කරන පරිශීලකයින්ගේ පහසුව ඉතා වැදගත් කොට සලකා ඇති අතර 2.2 සිට 2.13 ඇති මූලධර්ම නිශ්චිත අනුපිළිවෙලකට දක්වා නොමැත. සූචිකරණ මූලධර්ම 2.2 සිට 2.13 දක්වා ඇති නීති රීතිවල යම් ගැටළුවක් වේ නම් සූචිවල අන්තර්ක්‍රියාකාරීත්වය (interoperability) යන සිද්ධාන්තය අනෙක් කරුණු වලට වඩා ප්‍රමුඛතාවයෙන් සැලකිය යුතුය.

### 2.1 සූචි භාවිතා කරන පරිශීලකයින්ගේ පහසුව (Convenience of user)

සූචි භාවිතා කරන පරිශීලකයින්ගේ පහසුව යනුවෙන් අදහස් කරනුයේ සියලුම සූචිකරණ දත්ත (all data) සවිස්තරාත්මකව (comprehensible) පහසුවෙන් තේරුම් ගත හැකි වන පරිදි පරිශීලකයින්ට සුදුසු ආකාරයට තැබීමට සියලු උත්සාහයන් දැරීමයි. සූචිය ආධාර කරගෙන ග්‍රන්ථ විද්‍යාත්මක සහ හෝ සාධිකාරි දත්තයන් (bibliographic and / or authority data) භාවිතා කරන ඕනෑ ම කෙනෙක් මෙහි දී 'පරිශීලක' යන වචනයෙන් ආවරණය වී ඇත.

සූචි සංලේඛවල විස්තරය නැමැති කොටස සැකසීමේ දී සහ පාලනය කරන ලද නාම ප්‍රවේශ මාර්ග ලෙස යෙදීමේ දී (descriptions and controlled forms of names for access) ගනු ලබන තීරණ පරිශීලක සිතෙහි තබාගෙන කලයුතු වේ.

### 2.2 පොදු භාවිතය (Common usage)

සූචි සංලේඛවල විස්තරය සහ ප්‍රවේශ මාර්ග (access points) යෙදීමේ දී පරිශීලකයින් වැඩි දෙනෙක් භාවිතා කරන වචන (vocabulary) භාවිතා කළ යුතු වේ.

### 2.3 නියෝජනය (Representation)

සූචි සංලේඛයක විස්තරය (description) යම් විඥපනයක් (resource) ඉදිරිපත්කර ඇති ආකාරයට නියෝජනය (represent) විය යුතුය. පාලනය කරන ලද පුද්ගල නාමස්වරූප,

(controlled forms of names of persons) සංස්ථා නාම, (corporate bodies) සහ පවුල් නාම (families) එම නිර්මාණය (entity) විසින්ම විස්තර කර ඇති ආකාරය සුචි සංලේඛ සඳහා පදනම් කර ගත යුතු වේ. පාලනය කරන ලද කෘති නාම (controlled forms of works titles) සඳහා එම විඥපනයේ මුල් ප්‍රකාශයේ (original expression) යෙදා ඇති පළමු ප්‍රකාශිතයේ (first manifestation) කෘති නාම ස්වරූපය පදනම් කරගත යුතුවේ. එසේ කිරීමට නොහැකි නම් විමර්ශන මූලාශ්‍රවල (reference source) පොදුවේ භාවිතා කරන කෘති නාම ස්වරූපය (form) යොදාගත යුතුවේ.

2.4 නිරවද්‍යතාවය (Accuracy)
ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්ත විස්තර කරනු ලබන නිර්මාණයේ (entity) සත්‍ය දර්ශකයක් (accurate portrayal) විය යුතුය.

2.5 ප්‍රමාණවත් බව සහ අත්‍යවශ්‍යතාවය (Sufficiency and necessity)
මෙම දත්ත කාණ්ඩයන් (data elements) පහත සඳහන් කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඉවහල් විය යුතුවේ. සුවිශේෂ අවශ්‍යතා ඇති පරිශීලකයින් ඇතුළුව ඕනෑම අන්දමේ පරිශීලකයෙකුට (all types of users, those with specific needs) විඥපන වලට ප්‍රවේශ වීමට පහසුකම් තිබිය යුතුය (facilitate access). සුචියක අරමුණු සහ ඉන් සිදුවිය යුතු සේවා (objectives and functions) සාක්ෂාත් කරගැනීමට හැකිවිය යුතුයි. නිර්මාණයන් විස්තර කිරීමට හෝ නිර්මාණයන් හඳුනා ගැනීමට අවශ්‍ය කරුණු (describe or identify entities) අඩංගු විය යුතු වේ.

2.6 විශේෂත්වය (Significance)
දත්ත කාණ්ඩයන් (data elements) විඥපනයේ විස්තර වලට අදාල විය යුතුය (relevant). සඳහන් කිරීමට අවශ්‍ය කරුණු ඇතුලත් විය යුතුය (noteworthy). නිර්මාණයන් එකිනෙක වෙන්කර හඳුනා ගැනීමට හැකි විය යුතුය (allow for distinctions among entities).

2.7 වාසිදායක බව (Economy)
යම් අරමුණක් සාක්ෂාත් කරගැනීම සඳහා විවිධ මාර්ග ඇතිවිට සම්පූර්ණ ක්‍රියාවලියට යෝග්‍ය (expediency) සහ ප්‍රායෝගිකතාවය (practicality) වැඩි මාර්ගය කෙරෙහි වැඩි සැලකිල්ලක් දිය යුතුවේ. (නිදසුනක් ලෙස ගතහොත් අඩුම පිරිවැයක් (least cost) ඇති හෝ සරල මාර්ගය තෝරාගත යුතුවේ).

2.8 සංගතිය සහ ප්‍රමිතිකරණය (Consistency and Standardization)
සුචි සංලේඛවල විස්තරය (description) සහ ප්‍රවේශ මාර්ග සැකසීම හැකිතාක් දුරට ප්‍රමිතිකරණයට භාජනය කළ යුත්තේ සුචි සංලේඛවල සංගතිය (ඒකීයබව) රැක ගැනීම සඳහාය.

2.9 අනුකලනය (Integration)
සෑම මාදිලියකටම විඥපන සඳහා (all types of resources) සැකසිය යුතු විස්තරය (description) සහ සෑම මාදිලියකම නිර්මාණයන් සඳහා (all type of entities) යොදාගනු ලබන පාලනය කරන ලද නාම ස්වරූප (controlled forms of names) සඳහා හැකිතාක් දුරට පොදු නීති පද්ධතියක් (common set of rules) පදනම් කරගත යුතුවේ.

2.10 අන්තර්ක්‍රියාකාරීත්ව හැකියාව (Interoperability)
සෑම ප්‍රයත්නයක් ම ගත යුතු වන්නේ පුස්තකාල තුළ සහ පුස්තකාලවලින් බැහැරව සිටින

පරිශීලකයින්ට ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්ත බෙදාහදා ගැනීම සහ ඒවා අවශ්‍ය පරිදි නැවත භාවිතා කිරීම (reuse) තහවුරු කර දීම සඳහාත්ය. දත්ත හුවමාරුව සහ ගවේෂණ මෙවලම් සඳහා (exchange of data and discovery tools) අර්ථය පැහැදිලිවන, (disambiguation) ස්වයංක්‍රීය පරිවර්තනයක් පහසු කරවන (automatic translation) පදමාලාවක් (vocabularies) තිබීම තරයේ අනුමත කරනු ලැබ ඇත.

2.11 විවෘත භාවය (Openness)
දත්ත සඳහා පනවන සීමා (restrictions) අවම කල යුතුය. එසේ කළ යුතුවන්නේ 'ඉෆ්ලා විවෘත ප්‍රවේශ' ප්‍රකාශයට[5] (IFLA Statement on Open Access) අනුව දත්තවල විනිවිද භාවය (transparency) ආරක්ෂා කරගැනීම සඳහා සහ එම ප්‍රකාශයේ 'විවෘත ප්‍රවේශ මූලධර්මයන්ට' (Open Access Principles) අනුකූල වීම සඳහාත්ය. දත්තවලට ප්‍රවේශ වීම සඳහා යම් සීමාවන් පනවා ඇත්නම් ඒවා සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතු වේ.

2.12 ප්‍රවිශ්ට වීම (Accessibility)
ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්තවලට ප්‍රවිශ්ට වීමේ දී සහ විඥපන ගවේෂණය සඳහා භාවිතා කරන මෙවලම්වල ක්‍රියාකාරීත්වය (searching device functionalities) පුස්තකාලයාධිපතිවරුන් සහ අනෙකුත් විඥපන වේදීන්[6] සඳහා ඇති ඉෆ්ලා (IFLA) ආචාරධර්ම පද්ධතිය මගින් අනුමත කරන ලද (IFLA Code of elhics for librarians and other information workers) ජාත්‍යන්තර විඥපන ප්‍රවේශ ප්‍රමිතීන්ට (international standards for accessibility) අනුකූලව සිදුවිය යුතුවේ.

2.13 තර්කාන්විතභාවය (Rationality)
සුචි නීති මාලාවක (cataloguing code) ඇති සුචි නීතිවල නිරවද්‍යතාවය තර්කානුකූලව (defensible) ඔප්පු කළ හැකි විය යුතුය. ඒවා හිතුමතයට (arbitrary) සකසන ලද නීති නොවිය යුතුයි. විශේෂිත අවස්ථාවල සියලුම සුචිකරණ මූලධර්මයන්ට අනුකූලව ක්‍රියාකිරීමට නොහැකිවූ විට තර්කානුකූලව ඔප්පු කළ හැකි ප්‍රායෝගික විසඳුම් (practical solutions) ඒ සඳහා සොයාගතයුතු අතර එසේ කිරීමට හේතු වූ තර්කය (rationale) විස්තර කළ යුතුය.

## 3. නිර්මාණ (Entities) ගති ලක්ෂණ (Attributes) සහ සම්බන්ධතා (Relationships)

යම් විෂය පථයකට (domain) අදාලව ඇති නිර්මාණ (entities) පරිශීලකයින් විසින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන කරුණ වේ. මෙම නිර්මාණ එකිනෙක ඒවායේ ගති ලක්ෂණ නමින් (attributes) හැඳින්වෙන ඒවාට ආවේණික මුඛ්‍ය ලක්ෂණ අනුව (primary characteristics) විස්තර කල හැකිය. යම් නිර්මාණයක (entity) ඇති ගතිලක්ෂණ (attributes) පරිශීලකයින් විසින් එම නිර්මාණය පිළිබඳව තොරතුරු ගවේෂණයේ දී (seeking information) ගවේෂණාත්මක පැන (formulate queries) සැකසීම සඳහාත් ලැබෙන ප්‍රතිඵල (interpret responses) පැහැදිලි කර ගැනීම සඳහාත් උපයෝගී කර ගනු ලැබේ. සම්බන්ධතා (relationships) යනුවෙන් අදහස් කරනුයේ නිර්මාණ දෙකක් අතර හෝ නිර්මාණ අතර ඇති සහ සම්බන්ධතාවය වේ.

---

5. <www.ifla.org/node/8890>

6 <www.ifla.org/news/ifla-code-of-ethics-for-librarians-and-other-information-workers-full-version>

සුචිකරණයේ දී, නිර්මාණයන් (entities) ඒවායේ ගති ලක්ෂණ (attributes) සහ සම්බන්ධතා (relationships) ගැන සැලකිලිමත් විය යුත්තේ ග්‍රන්ථ විද්‍යාත්මක විශ්වයේ (bibliographic universe) පහදා දී ඇති සංකල්පමය ආකෘතීන්ට (conceptual models) අනුවය. මෙම සංකල්පමය ආකෘතීන් සැලකිල්ලට ගෙන ඇත්තේ සුචිසංලේඛ සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තා සඳහා කාර්යාත්මක අවශ්‍යතා, (FRBR), (Functional Requirements for Bilohographic Records) සාධිකාරී දත්ත සඳහා කාර්යාත්මක අවශ්‍යතා (FRAD) (Functional Requirements for Authority Data) සහ විෂය සාධිකාරී දත්ත සඳහා කාර්යාත්මක අවශ්‍යතා (FRSAD) (Functional Requirements for subject Aulhority Data) යනාදියයි.

3.1 නිර්මාණ (Entities) : පහත සඳහන් නිර්මාණ ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්තයන්[7] මඟින් නියෝජනය කල හැක.

කෘති (Work)
ප්‍රකාශය (Expression)
ප්‍රකාශිතය (Manifestation)
අයිතමය (Item)[8]
පුද්ගලයා (Person)
පවුල (Family)
සංස්ථා (Corporate Body)[9]
තේමාව (Theme)
නාම (නම්) (Nomen)[10]

3.2 ගතිලක්ෂණ (Attributes) : සෑම නිර්මාණයක්ම හඳුනාගැනීමට ඇති ගතිලක්ෂණ දත්ත කාණ්ඩ (data elements) ලෙස භාවිතා කල යුතුවේ.

3.3 සම්බන්ධතා (Relationships) : නිර්මාණයන් අතර ග්‍රන්ථ විද්‍යාත්මක වශයෙන් වැදගත් වන සම්බන්ධතා හඳුනාගත යුතු වේ.

---

7 Since the consolidation process involving FRBR, FRAD and FRSAD is currently underway, here are listed all the entities described in the aforementioned conceptual models. This brings some inconsistencies about Group 3 entities and about nomen in relation to names and access points.
8 Work, expression, manifestation, and item are the Group 1 entities described in the FRBR and FRAD models.
9 Person, family, and corporate body are the Group 2 entities as described in the FRAD model.
10 Thema (any entity used as a subject of a work) and nomen (any sign or sequence of signs by which a thema is known, referred to, or addressed as) are the entities introduced and described in the FRSAD model. Within the FRBR framework, thema includes Group 1 and Group 2 entities, and additionally, all others that serve as the subjects of works (i.e., Group 3 concept, object, event, and place). In FRSAD Nomen is a superclass of the FRAD entities name, identifier, and controlled access point. Being outside of its purpose, this Statement does not consider Nomen as the superclass of name, identifier and controlled access point.

## 4. ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය **(Bibliographic Description)**

4.1 සාමාන්‍යයෙන් සෑම ප්‍රකාශිතයන් සඳහා ම වෙන වෙනම ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයක් (Bibliographic Description) නිර්මාණය කළ යුතුය.

4.2 අයිතමය (Item) ප්‍රකාශිතයේ (manifestation) නියෝජනයක් (representative) ලෙස සලකා ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය විය යුතු අතර, අයිතමයට, අන්තර්ගත කෘතියට (embodied work(s)) සහ ප්‍රකාශයට (expression(s)) අදාල ගති ලක්ෂණ හෝ ගති ලක්ෂණය වලට ඇති සම්බන්ධතා අන්තර්ගත කල හැක.

4.3 විස්තරාත්මක දත්ත (Descriptive data) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් (internationally agreed standard) පදනම් කර ගත යුතු වේ. පුස්තකාල ප්‍රජාව සඳහා ඇති ප්‍රමිතිය වන්නේ ජාත්‍යන්තර ප්‍රමිති ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරයයි. (International standard Bibliographic Description (ISBD)[11]. වෙනත් ප්‍රමිතියක් මත පදනම් වී ඇති අවස්ථාවලදී භාවිතා කරන ප්‍රමිතිය සහ අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ විස්තරය (ISBD) අතර ප්‍රකාශිත සම්බන්ධීකරණය (published mapping) සඳහා විවෘත ප්‍රවේශයක් (open access) ලබා දීමට සෑම උත්සහයක්ම දැරිය යුතුයි. එසේ කළයුතු වන්නේ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර සඳහා වඩා යහපත් අන්තර් ක්‍රියාකාරීත්ව හැකියාවන් ඇති කිරීම (interoperability) සහ නිවැරදි ලෙස තොරතුරු (information ) නැවත භාවිතා කිරීම (reuse) සඳහාය.

4.4 සුචියක් හෝ ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත කට්ටලයක (data set) අභිප්‍රාය අනුව සුචි සංලේඛනයන්හි විස්තරය (descriptions) විවිධ පරිපූර්ණ මට්ටම්වල (several levels) තිබිය හැක. තොරතුරු පරිපූර්ණත්වය (completeness) කුමණ තලයක තිබේද යන්න පරිශීලකයාට දැනගැනීමට සැලැස්විය යුතුය.

## 5 ප්‍රවේශ මාර්ග **(Access Points)**

5.1 සාමාන්‍ය (General)

ග්‍රන්ථ විද්‍යාත්මක සහ සාධිකාරී දත්ත සම්මුද්දරණය (retrieving) සඳහා ප්‍රවේශ මාර්ග (access points) සැකසීමේදී සාමාන්‍ය මූලධර්ම (බලන්න 2. සාමාන්‍ය මූලධර්ම) අනුගමනය කළයුතු වේ. ප්‍රවේශමාර්ග (access points) පාලනය කරන ලද (controlled) හෝ පාලනය නොකරන ලද (uncontralled) ප්‍රවේශ මාර්ගයන් විය හැකිය.

5.1.1 පාලනය කරන ලද ප්‍රවේශ මාර්ගයන් සැපයිය යුත්තේ නීත්‍යානුකුල (authorised) සහ විවිධ නාම ස්වරූපයන් ඇති (variant forms of names) නිර්මාණයන්ට ය. ඒවා පුද්ගලයින් (person) , පවුල් (family), සංස්ථා (corporate body), කෘති (Work), ප්‍රකාශන (expression), ප්‍රකාශිතයන් (manifestation), අයිතම (item) සහ තේමා (theme) ලෙස ගත හැකිය. විඥපන කට්ටල (sets of resources) සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත එකතු කිරීමට (collocating) අවශ්‍ය සංගතනාම පාලනය කරන ලද ප්‍රවේශ මාර්ගයන සපයයි.

---

11 *ISBD : International Standard Bibliographic Description*. Consolidated ed. Berlin, München: De Gruyter Saur, 2011. (IFLA Series on Bibliographic Control; v. 44).

සාධිකාරී දත්ත සැකසිය යුත්තේ නීත්‍යානුකූල ස්වරූප (authorized forms of names) නාමවල විචල්‍ය ස්වරූප (variant forms of names) සහ වෙනත් හඳුනා ගැනීම් (identifiers) ප්‍රවේශ මාර්ග ලෙස (accespoints) යොදා ගැනීමේදී යම් පාලනයක් ඇති කිරීම උදෙසාය.

5.1.2 පාලනය නොකල ප්‍රවේශ මාර්ග (uncontrolled access points)

සාධිකාරී දත්තය වශයෙන් පාලනය නොකරන ලද නාම (names), ග්‍රන්ථ නාම (titles), (උදාහරණයක් වශයෙන් ප්‍රකාශිතයක ඇති තත්‍ය ග්‍රන්ථ නාමය (title proper)), සංකේත (code), නියමු පද (keywords) ආදිය සඳහා වන ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පාලනය නොකරන ලද ප්‍රවේශ මාර්ග වශයෙන් ලබාදිය හැකිය.

5.2 ප්‍රවේශ මාර්ගයන් තෝරා ගැනීම (Choice of access points)

5.2.1 කෘති (works) සහ ප්‍රකාශ (පාලනය කරන ලද) අන්තර්ගත විඥාපනයන් සඳහා නිත්‍යානුකූල ප්‍රවේශමාර්ගය, ප්‍රකාශිතයේ ග්‍රන්ථ නාමය (සාමාන්‍යයෙන් පාලනය නොකරන ලද) වේ. තව ද එම නිර්මාණශීලී කෘතිවල නිර්මාපකයින් (creators) ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ලෙස නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ග සඳහා ඇතුල් කළ යුතු වේ.

යම් සංස්ථාවක (corporate body) සාමූහික චින්තනය (collective thought) හෝ සාමූහික ක්‍රියාකාරකම් (activity) පෙන්වන කෘතියක නිර්මාපක ලෙස (creator of the work) සංස්ථා නාමය සැලකිය යුතු වේ. එසේ නැතහොත් කෘතියක ග්‍රන්ථ නාමය, කෘතියේ ස්භාවය (nature of the work) සමග වචනයෙන් බද්ද වී එම සංස්ථාව එම කෘතියේ අන්තර්ගතයට පැහැදිලිව ම වග කියන බව පෙන්වන අවස්ථාවලද එහි නිර්මාපක සංස්ථාව ලෙස සැලකේ. සංස්ථාවක නිලධාරියෙක් (officer) හෝ සේවකයකුගේ (servant) අත්සන සහිතව තිබුනද එම කෘතියට ඉහත නීති බලපානු ලැබේ.

5.2.2 විස්තර කරනු ලබන ග්‍රන්ථ විද්‍යාත්මක විඥාපනය (biographic resource) සොයා ගැනීම සහ හඳුනා ගැනීම සඳහා ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ලෙස පුද්ගලයින් නාම (persons), පවුල් (families), සංස්ථා (corporate bodies) සහ විෂය (subjects) නීත්‍යානුකූල අතිරේක ප්‍රවේශමාර්ග ලෙස (additional authorized access points) සැපයිය යුතු වේ.

5.2.3 නිර්මාණයක් (entity) සඳහා නීත්‍යානුකූල නාම ස්වරූපය (authorized forms of name) සහ එහි විචල්‍ය නාමද (variant forms of names) ප්‍රවේශ මාර්ගයන් ලෙස සාධිකාරී දත්තවලට ඇතුලත් කලයුතු වේ.

5.2.4 නිර්මාණයකට සම්බන්ධිත නිර්මාණ වලට (related entities) නාම මඟින් අතිරේක ප්‍රවේශ (additional access) සැපයිය හැකිය.

5.3 නිත්‍යානුකූල ප්‍රවේශමාර්ග (Authorized Access Points)

යම් නිර්මාණයක් (entity) සඳහා නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය (authorized access point ) ලෙස යොදා ගන්නා නාමය සාධිකාරී දත්තවල (authority data) සටහන් විය යුත්තේ එම නිර්මාණය වෙන්කොට හඳුනා ගැනීමට ඇති අනෙක් කරුණු (identifiers for the entity) සහ එම නාමයට ඇති විචල්‍ය නාමයන් ද (variant forms of names ) සමගය. සාධිකාරී ප්‍රවේශ මාර්ගය සුචියෙහි විකල්ප ප්‍රදර්ශණය (default form) සඳහා වන ස්වරූපය වශයෙන් භාවිතා කල හැක.

5.3.1. නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ග යම් ප්‍රමිතියක් (Standard) අනුව සැකසිය යුතු වේ.

5.3.2. නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගයන් හි භාෂාව සහ අක්ෂර (Language and Script)

5.3.2.1. කෘතියක් සඳහා නාම (names) විවිධ භාෂාවන්ගෙන් සහ/හෝ විවිධ අක්ෂර මාලාවන්ගෙන් ප්‍රකාශිත වී ඇත්නම්, නාමය සඳහා නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය ලෙස තෝරා ගත යුත්තේ මුල් භාෂාව සහ මුල් අක්ෂර මාලාවෙන් (Original language and script) ප්‍රකාශිත කෘතියෙහි විද්‍යාමාන වන තොරතුරු පදනම් කරගෙනය.

5.3.2.1.1. කෙසේ වුවද, මුල් භාෂාව සහ/හෝ මුල් අක්ෂර මාලාව සුචිය සඳහා සාමාන්‍යයෙන් භාවිතා නොවේ නම් නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය සඳහා යෙදිය යුත්තේ තිබෙන ප්‍රකාශයන් හි විද්‍යාමාන වන ස්වරූපයන් (forms) හෝ විමර්ශන මූලාශ්‍රයන් හි ඇතුලත් වී ඇති භාෂා අතුරින් එක් භාෂාවක් සහ/හෝ අක්ෂර මාලාවක් භාවිතා කිරීමය. එය සුචිය භාවිතා කරන පරිශීලකයින්ට වඩා උචිත භාෂාව යෝ අක්ෂර මාලාව විය යුතුය.

5.3.2.1.2. නාමයේ සාධිකාරී ස්වරූපය හෝ නාමයේ විචල්‍ය ස්වරූපය පාලනය කරන ලද ප්‍රවේශ මාර්ගය (controlled access point) හරහා හැකි සෑම අවස්ථාවකම මුල් භාෂාව සහ අක්ෂර මාලාවෙන් කෘතිය සඳහා ප්‍රවේශය (access) ලබා දිය යුතුය.

5.3.2.2. අක්ෂර පරිවර්තනයන් (transliterations) අපේක්ෂිත නම්, අක්ෂර පරිවර්තනය කිරීමේ (script conversion) ජාත්‍යන්තර ප්‍රමිතියක් අනුගමනය කළ යුතුවේ.

5.3.3. කැමති නම තෝරා ගැනීම (Choice of Preferred Name)

නිර්මාණයක් සඳහා නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය ලෙස (authorized access point) තෝරා ගනු ලබන නාමය (name preferred) ස්ථාවර ආකාරයකට (consistent manner) එම නිර්මාණය හඳුන්වාදෙන (identifies the entity) නාමයක්ය යන්න පදනම් කරගත යුතුයි. එය නිතර ප්‍රකාශනයන් මඟින් සොයා ගත හැකි හෝ සුචිය භාවිතා කරන පරිශීලකයන්ට වඩා සුදුසු, විමර්ශන මූලාශ්‍රයන්හි වඩා පිළිගත් (well accepted) නාමයක් (උදාඃ- අවේනික නාමය) (conventional name) විය යුතුය.

5.3.3.1. පුද්ගල නාම, (Name of Persons) පවුල් (Families) සහ සංස්ථා (Corporate Bodies) තේරීම.

පුද්ගලයෙක් නාමයක් (Person), පවුලක් (family) හෝ සංස්ථාවක් (corporate body) විවිධ නාමයන් (විචල්‍ය නාමයන්) (variant names) හෝ විවිධ නාම ස්වරූප (variant forms of names) භාවිතා කරයි නම් නීත්‍යානු කූල ප්‍රවේශ මාර්ගය සඳහා එක් නාමයක් හෝ එක් නාම ස්වරූපයක් පදනම වශයෙන් තෝරාගත යුතුවේ.

5.3.3.1.1. නාමය විචල්‍ය ස්වරූපයන් (variant forms) ප්‍රකාශිතයේ සහ/හෝ විමර්ශන මූලාශ්‍රයන්හි සඳහන් වේ නම්, එම විචල්‍යතාවය (variation) එකම නම විවිධ ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමක්ය. (උදාහරණ වශයෙන් සම්පූර්ණ නම සහ එහි කෙටි යෙදුමක්) (full and brief forms) යන පදනම මත පිහිටා කටයුතු නොකරන කල්හි තෝරා ගැනීමේ අභිමතය (preference) විය යුත්තේ

(a) නිත්‍යානුකූල නාමය සඳහන් වී තිබුණද වඩා ප්‍රචලිත නාමය (commonly known) හෝ ආවේණික නාමයයි (conventional).
(b) වඩා ප්‍රචලිත නාමයක් හෝ ආවේණික නාමයක් සඳහන් වී නැති අවස්ථාවක (no indication of a commonly known or conventional name) නීත්‍යානුකූල නාමය (official name) යොදා ගතයුතුවේ.

5.3.3.1.2. සංස්ථා නාමයක් යම් කාල වකවානුවක් තුළ (successive periods) එක දිගටම වෙනස් නාමයන් භාවිතා කර ඇත්ද, ඒවා එකම නාමයක සුළු වෙනස්කම් ලෙස (minor variations) සැලකිය නොහැකි නම් සෑම කැපී පෙනෙන (significant name) වෙනස් වූ නාමයක්ම අළුත් නිර්මාණයක් (new entity) ලෙස සැලකිය යුතු වේ. එම සංස්ථා නාමයේ සාධිකාරි දත්ත (authority data) සාමාන්‍යයෙන් පැවති නාමය (earlier name) සහ පසුකාලීන නිත්‍යානු කූල සංස්ථා නාමය සමග සම්බන්ධ කර තිබිය යුතුවේ.

5.3.3.2. කෘතීන් (works), ප්‍රකාශයන් (expressions), ප්‍රකාශිතයන් (manifestations) සහ අයිතමයන් (items) සඳහා අභිමත ග්‍රන්ථ නාමයන් තෝරා ගැනීම.

යම් කෘතියක් සඳහා බහුවිධ ග්‍රන්ථ නාමයන් (multiple titles) ඇති කල්හි, එම කෘතිය, ප්‍රකාශය, ප්‍රකාශිතය හෝ අයිතමය සඳහා එක් ග්‍රන්ථ නාමයක් (one title) පමණක් නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය ලෙස අභිමතය පරිදි පදනම් කරගත යුතුවේ.

කෘතියක් සඳහා බහුවිධ (විචල්‍ය) ග්‍රන්ථ නාම ස්වරූපයන් ඇති කල්හි අභිමතය (preference) විය යුත්තේ,

(a) කෘතියක මුල් ප්‍රකාශයේ (original expression), පළමු ප්‍රකාශිතයෙහි විiමාන සාමාන්‍යයෙන් මුල් භාෂාවෙන් ඇති ග්‍රන්ථ නාමය හෝ
(b) පොදුවේ භාවිතා කරන ග්‍රන්ථ නාමයි.

5.3.4. නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගයන් සඳහා නාම ස්වරූප (form of name) තෝරා ගැනීම.

5.3.4.1. පුද්ගලයින් සඳහා නාම ස්වරූප (form of name for Persons)

යම් පුද්ගල නාමයක් (name of the person) වචන කිහිපයකින් (several words) සමන්විත වී ඇතිනම්, ප්‍රකාශිත (manifestations) හෝ විමර්ශන මූලාශ්‍ර (reference sources) මගින් සොයා ගත හැකි වී ඇති පරිදි, රටේ සම්මුතිය (convention of the country) සහ එම පුද්ගලයා වැඩිය ඇසුරු කළ භාෂාව (language most associated with the person) අනුව එම පුද්ගල නාමයේ ප්‍රථම වචනය (first word) නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය ලෙස තෝරා ගතයුතුවේ[12].

5.3.4.2. පවුල් සඳහා නාම ස්වරූප (Form of Names for Families)

යම් පවුල් නාමයක් වචන කිහිපයකින් සමන්විත වී ඇත්නම්, ප්‍රකාශිතයන් හෝ විමර්ශන මූලාශ්‍ර මගින් සොයා ගතහැකි වී ඇති පරිදි, රටේ සම්මුතිය සහ එම පවුල් නාමය වැඩියෙන් ඇසුරු කල භාෂාව අනුව පවුල් නාමයේ ප්‍රථම වචනය නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය ලෙස තෝරා ගතයුතුවේ.

5.3.4.3. සංස්ථා සඳහා නාම ස්වරූප (Form of name for Corporate Bodies)

සංස්ථා නාමයක් සඳහා නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය විය යුත්තේ ප්‍රකාශිතයන් හෝ විමර්ශන මූලාශ්‍රයන් මගින් සොයා ගත හැකිවී ඇති පරිදි එම සංස්ථාවට අනුගත නාමයයි. (direct order) එසේ නොවිය යුත්තේ,

5.3.4.3.1. යම් සංස්ථා නාමයක් යම් අධිකරණ බලසීමාවක (jurisdiction) හෝ රාජ්‍ය අධිකාරයකට (territorial authority)අයිති කොටසක් වේ නම් සුවිය භාවිතා කරන පරිශීලකයින්ගේ අවශ්‍යතාවයනට වඩාත් උචිත භාෂාවකින් හෝ අක්ෂරයන්ගෙන් එම දේශයේ වර්තමාන නම (currently used form of the name of the territory) එම සංස්ථා නාමය සඳහා නිත්‍යානුකූල ප්‍රවේශ මාර්ගයට ඇතුළත් කළ යුතුවේ.

